ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකː 2477424, 2477423, 2477311
ෆැක්ස්ː 2346257, 2477739
ඊ-මේල්ː dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියː www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2017 අගෝස්තු මස 25 වැනි දින** |

## 2017 ජුනි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

වෙළඳ ශේෂයේ සැලකිය යුතු වර්ධනය සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ අඛණ්ඩ ලැබීම් හේතුවෙන් 2017 වසරේ ජුනි මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ යම් වර්ධනයක් පෙන්නුම් කෙරිණි. කාර්මික සහ කෘෂිකාර්මික අපනයනවල සැලකිය යුතු වර්ධනය සහ පාරිභෝගික හා අන්තර් භාණ්ඩ ආනයනය අඩුවීම, 2017 වසරේ ජුනි මාසයේ දී වෙළඳ ශේෂය කැපී පෙනෙන ලෙස වර්ධනය වීම සඳහා හේතු විය. මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම්, ප්‍රධාන වශයෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ අඛණ්ඩ ලැබීම් මඟින් පෙන්නුම් කෙරුණු අතර, කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන ද මාසය තුළ දී ධනාත්මකව පැවතුණි. ජංගම ගිණුම වෙත වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩුවීමත් සමඟ මධ්‍යස්ථව පැවති අතර සංචාරක ඉපැයීම් ද මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. මූල්‍ය ගිණුමේ හිතකර වර්ධනයන් සහ අපනයන ආදායම් ලැබීම්වල ක්‍රමික වර්ධනය, විදේශීය විනිමය වෙළඳපොළ ස්ථාවර මට්ටමකට පත් කළ අතර, එය වසර ආරම්භයට සාපේක්ෂව 2017 වසරේ ජුනි මස අවසානය වන විට දළ නිල සංචිත ඉහළ යෑම සඳහා හේතු විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

2017 ජුනි මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 9.6 ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ.ඩොලර් මිලියන 987 ක් දක්වා අඛණ්ඩව සිව්වැනි මාසයටත් ඉහළ ගියේය. මෙම වර්ධනය සඳහා කාර්මික අපනයන ඉහළම දායකත්වයක් (සියයට 77.1 ක්) දැක්වූ අතර, දෙවනුව කෘෂිකාර්මික අපනයන (සියයට 20.6 ක්) දායක විය.

2017 ජුනි මාසයේ දී ප්‍රවාහන උපකරණ අපනයන ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව කාර්මික අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 750 ක් දක්වා සියයට 9.8 කින් ඉහළ ගියේය. 2017 ජුනි මාසයේ දී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ආසන්නව හත් ගුණයකින් පමණ වැඩි වෙමින් එ.ජ. ඩොලර් මිලියන 54 ක් දක්වා ඉහළ ගිය අතර, ඒ සඳහා සිංගප්පූරුව වෙත නැව් දෙකක් අපනයනය කිරීම හේතු විය. මීට අමතරව, ආහාර හා පාන වර්ග, රබර් නිෂ්පාදිත සහ ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම් ඉහළ යෑම ද කාර්මික අපනයන ආදායම ඉහළ යෑම සඳහා සැලකිය යුතු ලෙස දායක විය. 2017 ජුනි මාසයේ දී ආහාර හා පාන වර්ග අපනයන ආදායම දෙගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. සියලුම උපකාණ්ඩවල අපනයන වර්ධනය හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 15.4 කින් ඉහළ ගියේය. නැව් සහ ගුවන්යානා සඳහා භාවිතා කරනු ලබන ඉන්ධනවල අපනයන පරිමා සහ මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 ජුනි මාසයේ ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 26.7 කින් ඉහළ ගියේය. කෙසේ වුව ද, ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයනවල පහළ යෑම පිළිබිඹු කරමින් මුළු අපනයන ආදායමෙන් සියයට 40 ක් පමණ වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම 2017 ජුනි මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 7.5 කින් එ.ජ.ඩොලර් මිලියන 398 ක් දක්වා පහත වැටුණි. මෙම මාසය තුළ සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම් ද පහළ ගියේය.

පොල් සහ කුළුබඩු හැර අනෙකුත් සියලුම ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදිතවල අපනයන ඉහළ යෑම පිළිබිඹු කරමින්, 2017 ජුනි මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 232 ක් දක්වා සියයට 8.3 කින් ඉහළ ගියේය. තේ අපනයන පරිමාව සියයට 9.5 කින් අඩු වුව ද, ඉහළ මිල ගණන්

හේතුවෙන් තේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 139 ක් දක්වා සියයට 13.7 කින් ඉහළ ගියේය. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පවතින ඉහළ තේ මිල ගණන් හා සමගාමීව ශ්‍රී ලංකාවේ තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල 2016 ජුනි මාසයේ පැවති කිලෝග්‍රෑමයට එ.ජ.ඩොලර් 4.27 සිට 2017 ජුනි මාසයේ දී කිලෝග්‍රෑමයට එ.ජ.ඩොලර් 5.36 දක්වා ඉහළ ගියේය. මෙම මාසය තුළ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම ද සියයට 30.8 කින් ඉහළ ගියේය. යුරෝපා වෙළඳපොළ වෙත මත්ස්‍ය නිෂ්පාදිත අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීමේ ප්‍රතිලාභ ලබමින් 2017 ජුනි මාසයේ දී මුහුදු ආහාර අපනයන ආදායම අඛණ්ඩව ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ මුහුදු ආහාර අපනයන ආදායමෙහි සියයට 101.2 ක වර්ධනයක් වාර්තා කරමින් 2017 ජුනි මාසයේ දී මුහුදු ආහාර අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 15 ක් දක්වා සියයට 17.4 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, කුරුඳු සහ කරාබුනැටි අපනයනය සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, ගම්මිරිස් සහ සාදික්කා හා වසාවාසිවල අපනයන පරිමාව මෙන්ම, අපනයන මිල ගණන් ද පහළ යෑම පිළිබිඹු කරමින් කුළුබඩු අපනයන ආදායම සියයට 12.9 කින් පහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, තේ, ප්‍රවාහන උපකරණ, ඛනිජතෙල් නිෂ්පාදිත සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයනය කිරීමෙන් ලැබූ ඉහළ ආදායම හේතුවෙන් 2017 වසරේ පළමු භාගය තුළ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 5,398 ක් දක්වා සියයට 5.2 කින් වර්ධනය විය. කෙසේ වුවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම් පහළ ගියේය.

2017 වසරේ පළමු භාගය තුළ ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය පැවති අතර, එම රටවල් වෙත සිදු කළ අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 50 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2016 ජූනි (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන - ජූනි (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජන - ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **682.9** | **749.8** | **9.8** | **4,004.5** | **4,065.8** | **1.5** |
| රෙදිපිළි හා ඇඟලුම් | 430.2 | 398.1 | (7.5) | 2,514.7 | 2,383.6 | (5.2) |
| එයින්, ඇඟලුම් | 407.3 | 375.4 | (7.8) | 2,377.0 | 2,244.7 | (5.6) |
| රබර් නිෂ්පාදිත | 63.3 | 73.1 | 15.4 | 372.0 | 388.5 | 4.4 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 28.7 | 58.9 | 105.1 | 174.0 | 190.8 | 9.7 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 24.0 | 28.5 | 18.7 | 142.5 | 180.4 | 26.6 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 23.0 | 29.2 | 26.7 | 132.2 | 176.9 | 33.8 |
| ප්‍රවාහන උපකරණ | 7.6 | 54.3 | 615.9 | 67.1 | 125.0 | 86.2 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 21.9 | 20.6 | (5.5) | 148.4 | 123.9 | (16.5) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 19.4 | 15.4 | (20.3) | 81.6 | 77.7 | (4.8) |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 7.6 | 6.8 | (10.0) | 36.8 | 51.4 | 39.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.1 | 4.0 | 91.3 | 10.2 | 17.7 | 74.4 |
| වෙනත් | 55.2 | 60.9 | 10.3 | 325.0 | 349.8 | 7.6 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **214.1** | **232.0** | **8.3** | **1,104.7** | **1,306.4** | **18.3** |
| තේ | 121.9 | 138.6 | 13.7 | 618.4 | 728.4 | 17.8 |
| පොල් | 31.5 | 30.1 | (4.2) | 174.2 | 173.8 | (0.2) |
| කුළුබඩු | 32.0 | 27.8 | (12.9) | 125.3 | 160.7 | 28.2 |
| මුහුදු ආහාර | 12.9 | 15.2 | 17.4 | 83.5 | 117.1 | 40.3 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 10.0 | 13.1 | 30.8 | 56.9 | 71.4 | 25.6 |
| රබර් | 1.8 | 2.0 | 10.1 | 17.0 | 23.9 | 40.8 |
| සකස් නොකළ දුම්කොළ | 1.9 | 2.9 | 52.6 | 16.3 | 16.4 | 0.9 |
| එළවළු | 2.1 | 2.3 | 4.9 | 13.2 | 14.7 | 10.8 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **3.5** | **5.5** | **56.3** | **21.2** | **25.4** | **19.8** |
| **මුළු අපනයන** | **900.6** | **987.3** | **9.6** | **5,130.3** | **5,397.6** | **5.2** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

**ආනයන ක්‍රියාකාරිත්වය**

ආනයන වියදම, 2016 සැප්තැම්බර් මාසයෙන් පසුව ප්‍රථම වරට පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු වීමක් පිළිබිඹු කරමින් 2017 ජූනි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 1,541 ක් දක්වා සියයට 8.0 කින් පහළ ගියේය. මෙමගින් සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පහළ යෑම පිළිබිඹු කළ අතර, විශේෂයෙන්ම අන්තර් භාණ්ඩ ආනයන පහළ ගියේය.

2017 ජූනි මාසයේ දී ප්‍රධාන වශයෙන්ම, ඉන්ධන ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 792 ක් දක්වා සියයට 12.9 කින් පහළ ගියේය. බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිතවල ආනයන පරිමා සහ සාමාන්‍ය ආනයන මිල ගණන් පහළ යෑම පිළිබිඹු කරමින් 2017 ජූනි මාසයේ දී ඉන්ධන ආනයන වියදම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 34.1 කින් පහළ ගියේය. මීට අමතරව, යකඩ හා වානේ වැනි මූලලෝහ මෙන්ම විශේෂයෙන්ම ප්‍රාථමික ස්වරූපයේ රබර් ඇතුළු රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම අඩු වීම අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ යෑම කෙරෙහි සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වුව ද, රත්‍රන් ආනයන වියදම අඛණ්ඩව තවදුරටත් සියයට 42.3 කින් ඉහළ ගිය අතර, යූරියා ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2016 අගෝස්තු මාසයෙන් පසුව ප්‍රථම වරට පොහොර ආනයන වියදම ඉහළ ගියේය. මීට අමතරව, 2017 ජූනි මාසයේ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.7 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය විය.

ප්‍රධාන වශයෙන්ම, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, රෙදිපිළි සහ උපාංග, පෞද්ගලික රථවාහන සහ විදුලි සන්දේශ උපකරණ වැනි ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය පහළ යෑම හේතුවෙන් 2017 ජූනි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 323 ක් දක්වා සියයට 8.9 කින් පහළ ගියේය. මීට අමතරව, මයිසූර් පරිප්පු, සුදුළූණු, කුළුබඩු, පාන වර්ග හා මුහුදු ආහාර වැනි ආහාර හා පාන වර්ග ආනයන වියදම ද පහළ ගියේය. කෙසේ වුවද, 2017 ජනවාරි මාසයේ සිට සහල් ආනයනවල දක්නට ලැබුණු ඉහළ යෑමේ ප්‍රවණතාව 2017 ජූනි මාසයේදීත් අඛණ්ඩව පැවතුණි. මේ අනුව, 2016 ජූනි මාසයේ දී ආනයනය කළ සහල් කිලෝග්‍රෑම් මිලියන 2 ට සාපේක්ෂව 2017 ජූනි මාසයේ සහල් ආනයන පරිමාව කිලෝග්‍රෑම් මිලියන 16 දක්වා ඉහළ යෑම හේතුවෙන් සහල් ආනයන වියදම අට ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. තවද, ප්‍රධාන වශයෙන්ම සීනි ආනයන මිල ගණන් ඉහළ යෑම

හේතුවෙන් සීනි ආනයන වියදම පෙර වසරේ එම මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 26 ක් දක්වා සියයට 3.4 කින් ඉහළ ගියේය.

ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනය පහළ යෑම හේතුවෙන් 2017 ජුනි මාසයේ ආයෝජන භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 405 ක් දක්වා සියයට 1.2 කින් සුළු වශයෙන් පහළ ගියේය. යකඩ හා වානේ, සිමෙන්ති, දැව නිෂ්පාදිත, පිඟන් මැටි නිෂ්පාදිත සහ ඛනිජ නිෂ්පාදිත ආනයන පහළ යෑම හේතුවෙන් 2017 ජුනි මාසයේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 6.8 කින් පහළ ගියේය. රෙදිපිළි කර්මාන්තය සඳහා යොදා ගනු ලබන යන්ත්‍රසූත්‍ර, විදුලි මෝටර් හා විදුලිජනක කට්ටල, කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර සහ විදුලි සන්දේශ උපකරණ ආනයනයෙහි පහළ යෑම පිළිබිඹු කරමින් මෙම මාසය තුළ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම සියයට 2.0 කින් අඩු විය. කෙසේ වුව ද, 2017 ජුනි මාසයේ දී ප්‍රධාන වශයෙන්ම වෑන් රථ, ටැංකි හා බවුසර් ආනයනය ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 19.1 කින් ඉහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, 2017 වසරේ පළමු භාගය තුළ ප්‍රධාන වශයෙන්ම ඉන්ධන, රත්‍රන් සහ සහල් ආනයනය විශාල වශයෙන් ඉහළ යෑම හේතුවෙන් ආනයන වියදම 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 10,151 ක් දක්වා සියයට 8.9 කින් ඉහළ ගියේය. කෙසේ වුව ද, මෙම කාලපරිච්ඡේදය තුළ යන්ත්‍රසූත්‍ර හා උපකරණ, පෞද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා රථවාහන සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම් පහළ ගියේය.

2017 වසරේ පළමු භාගය තුළ ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස පැවති අතර, එම රටවල් වෙතින් සිදු කරන ලද ආනයන ප්‍රමාණය, මුළු ආනයනවලින් සියයට 59 ක් පමණ විය.


# සංඛ්‍යා සටහන 2: ආනයන වියදම (අ)


| කාණ්ඩය | 2016 ජුනි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජුනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන - ජුනි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන - ජුනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **354.1** | **322.7** | **(8.9)** | **2,107.7** | **2,223.9** | **5.5** |
| ආහාර හා පානවර්ග | 137.4 | 131.4 | (4.3) | 775.7 | 923.5 | 19.1 |
| එළවළු | 32.8 | 27.1 | (17.5) | 198.3 | 176.7 | (10.9) |
| කිරි නිෂ්පාදිත | 22.4 | 23.5 | 5.0 | 119.4 | 160.4 | 34.3 |
| සීනි හා රසකැවිලි | 25.0 | 25.9 | 3.8 | 133.7 | 150.7 | 12.7 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.7 | 7.5 | 331.6 | 11.0 | 138.1 | 1,157.6 |
| කුළුබඩු | 10.6 | 7.3 | (31.8) | 67.0 | 50.7 | (24.3) |
| පාන වර්ග | 9.2 | 6.0 | (34.6) | 42.5 | 38.9 | (8.5) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 35.6 | 34.1 | (4.2) | 203.8 | 208.0 | 2.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 216.7 | 191.3 | (11.7) | 1,332.0 | 1,300.4 | (2.4) |
| රථවාහන | 56.9 | 54.0 | (5.1) | 419.3 | 370.2 | (11.7) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 53.0 | 45.0 | (15.2) | 264.3 | 248.7 | (5.9) |
| රෙදිපිළි හා උපාංග | 28.3 | 24.5 | (13.5) | 172.0 | 198.9 | 15.6 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 78.5 | 67.8 | (13.6) | 476.4 | 482.6 | 1.3 |
| **2. අන්තර් භාණ්ඩ** | **909.7** | **792.1** | **(12.9)** | **4,780.4** | **5,349.0** | **11.9** |
| ඉන්ධන | 304.2 | 200.6 | (34.1) | 1,177.8 | 1,624.5 | 37.9 |
| එයින්, බොරතෙල් | 107.8 | 35.6 | (67.0) | 267.7 | 279.4 | 4.4 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 196.3 | 164.9 | (16.0) | 813.6 | 1,174.3 | 44.3 |
| ගල්අඟුරු | 0.1 | 0.0 | (99.9) | 96.5 | 170.8 | 77.0 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 44.1 | 56.9 | 28.8 | 213.0 | 328.0 | 54.0 |
| එයින්, රත්‍රන් | 32.3 | 46.0 | 42.3 | 145.6 | 274.9 | 88.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 215.4 | 219.0 | 1.7 | 1,346.7 | 1,306.9 | (3.0) |
| රසායනික නිෂ්පාදිත | 70.3 | 67.1 | (4.7) | 435.9 | 408.2 | (6.4) |
| මූල ලෝහ | 56.5 | 32.5 | (42.5) | 190.2 | 251.9 | 32.5 |
| තිරිඟු හා ඉරිඟු | 5.9 | 7.3 | 22.9 | 133.1 | 162.5 | 22.1 |
| රථවාහන හා යන්ත්‍රසූත්‍ර කොටස් | 26.3 | 21.6 | (17.7) | 144.2 | 147.8 | 2.5 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 25.3 | 20.5 | (19.1) | 148.6 | 142.2 | (4.3) |
| පොහොර | 6.5 | 12.0 | 85.8 | 74.9 | 39.1 | (47.7) |
| සකස් නොකළ දුම්කොළ | 4.1 | 7.2 | 74.0 | 32.8 | 27.1 | (17.5) |
| වෙනත් | 151.1 | 147.6 | (2.3) | 883.3 | 910.8 | 3.1 |
| **3. ආයෝජන භාණ්ඩ** | **410.1** | **405.3** | **(1.2)** | **2,426.7** | **2,447.2** | **0.8** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 224.6 | 220.2 | (2.0) | 1,371.9 | 1,319.0 | (3.9) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 137.9 | 128.5 | (6.8) | 760.7 | 789.6 | 3.8 |
| ප්‍රවාහන උපකරණ | 46.8 | 55.8 | 19.1 | 290.9 | 333.8 | 14.7 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.7 | 0.8 | 21.4 | 3.3 | 4.7 | 45.0 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.9** | **20.8** | **974.2** | **6.2** | **130.9** | **2,014.9** |
| **මුළු ආනයන** | **1,675.8** | **1,540.9** | **(8.0)** | **9,321.0** | **10,151.0** | **8.9** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

### වෙළඳ ශේෂය

2017 ජුනි මාසයේ වෙළඳ හිඟය, 2016 ජුනි මාසයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 775 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 554 ක් දක්වා අඩු විය. කෙසේ වුව ද, 2017 වසරේ පළමු භාගය තුළ සමුච්චිත වෙළඳ හිඟය, 2016 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,191 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 4,753 ක් දක්වා පුළුල් විය.

### සංචාරක ඉපැයීම්

2017 වසරේ ජුනි මාසයේ දී සංචාරක පැමිණීම් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 4.5 කින් වර්ධනය වූ අතර සංචාරක පැමිණීම් සංඛ්‍යාව 123,351 ක් විය. 2017 වසරේ පළමු භාගයේ දී, මුළු සංචාරක පැමිණීම්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 4.8 කින් වර්ධනය විය. 2017 වසරේ ජුනි මාසයේ දී සංචාරක ඉපැයීම් ද සංචාරක පැමිණීම් මෙන්ම වැඩිවීමක් වාර්තා කළ අතර, සංචාරක ඉපැයීම්[1] එ.ජ. ඩොලර් මිලියන 211.6 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසරේ පළමු භාගයේ දී සමුච්චිත සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 1,733.6 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය විය. මැදපෙරදිග කලාපයෙන් පැමිණෙන සංචාරකයන්ගේ අඩුවීම සහ චීනයෙන් පැමිණෙන සංචාරකයන් ප්‍රමාණයේ අඩු වර්ධනය මෙන්ම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ධාවන පථය අලුත්වැඩියා කිරීමේ කටයුතු හේතුවෙන් සමහර ගුවන්

---

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2017 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

ගමන් කාලසටහන් වෙනස් කිරීම ද, 2017 වසරේ පළමු භාගයේ දී සංචාරක ඉපැයීම්වල මධ්‍යස්ථ වර්ධනය සඳහා හේතු විය.

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**

2017 වසරේ ජූනි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු අඩුවීමක් වාර්තා වූ අතර, එය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී එ.ජ. ඩොලර් මිලියන 557.6 ක් දක්වා සියයට 13.5 කින් අඩු වීමකි. මැදපෙරදිග කලාපයේ පවතින අහිතකර ආර්ථික හා භූ-දේශපාලනික තත්ත්වයන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්හි අඛණ්ඩ අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසරේ පළමු භාගයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම්, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,354.7 ක් දක්වා සියයට 7.2 කින් අඩු විය.

**මූල්‍ය ලැබීම්**

ආයෝජකයන් තුළ ඇති අඛණ්ඩ විශ්වාසය පිළිඹිබු කරමින්, මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම්වල පසුගිය මාසය තුළ දී දක්නට ලැබුණු ධනාත්මක ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි. 2017 වසරේ ජූනි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 97.6 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසරේ පළමු භාගයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි සමුච්චිත විදේශීය ආයෝජන ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 153 ක් දක්වා අඩුවිය. තවද, වසරේ පළමු භාගයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 229.3 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය පිළිවෙළින්, ද්විතීයික වෙළඳපොළ වෙත හා ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 145.9 ක හා එ.ජ. ඩොලර් මිලියන 83.4 ක ශුද්ධ ලැබීම්වලින් සමන්විත විය. මේ අතර , 2017 වසරේ පළමු භාගයේ දී ඒකාබද්ධ ණය පහසුකම තුළින් ලද මුදල් ද ඇතුළු රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 98.3 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 493.3 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2017 වසරේ පළමු භාගයේ දී සමස්ත ගෙවුම් තුලනය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,186.1 ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,563.4 ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව තුළින් සහ ඒකාබද්ධ ණය පහසුකම තුළින් ලද මුදල් හේතුවෙන් 2017 වසරේ ජුනි මස අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.0 ක් විය. දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.1 කට ප්‍රමාණවත් වූ අතර, මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.3 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 9.1 ක් විය.

ශ්‍රී ලංකා රුපියල 2016 වසර අවසානයේ සිට 2017 අගෝස්තු මස 24 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.0 කින් මධ්‍යස්ථ ලෙස අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකක වන යුරෝවලට සාපේක්ෂව සියයට 12.5 කින් ද, ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සියයට 5.9 කින් ද, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 8.1 කින් ද, කැනේඩියානු ඩොලරයට සාපේක්ෂව සියයට 8.8 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව සියයට 10.2 කින් ද සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 7.6 කින් ද අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන - ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන - ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 900.6 (ආ) | 987.3 | 9.6 | 5,130.3 | 5,397.6 | 5.2 |
| ආනයන | 1,675.8 | 1,540.9 | -8.0 | 9,321.0 | 10,151.0 | 8.9 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -775.2 | -553.6 | - | -4,190.7 | -4,753.5 | - |
| සංචාරක ඉපැයීම් | 202.5 (ආ) | 211.6 | 4.5 | 1,654.3 (ආ) | 1,733.6 | 4.8 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 644.5 | 557.6 | -13.5 | 3,613.1 | 3,354.7 | -7.2 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | -3.6 | 38.2 | - | -40.9 | 229.3 | - |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) එයින්, | 299.5 (ආ) | 304.0 | 1.5 | 1,137.1(ආ) | 3,353.0 | 194.9 |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 193.6 | 157.7 | -18.5 | 601.1 | 729.8 | 21.4 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | - | 1,500.0 | - |
| ඒකාබද්ධ ණය පහසුකම | - | - | - | - | 450.0 | - |
| දිගුකාලීන ණය | 100.9 (ආ) | 141.3 | 40.1 | 520.3(ආ) | 1,110.5 | 113.4 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 129.4 | 146.5 | 13.2 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.
(ඉ) දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් වේ.